# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1952/10 - 2016 පෙබරවාරි මස 01 වැනි සඳුදා - 2016.02.01**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### රේගු නිවේදනයයි

ආදායම් සංරක්ෂණ ආඥාව - අංක 01/2016

**1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනත**

1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනතේ 2 වැනි වගන්තියෙන් මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඔහු විසින් පනවන ලද පහත සඳහන් ආඥාව මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

ආර්. එච්. එස්. සමරතුංග,
ලේකම්,
මුදල් අමාත්‍යාංශය.

2016 පෙබරවාරි මස 01 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

02-524/1

---

**1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනත**

ආඥාව

1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනතේ 2 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් අමාත්‍ය රවි කරුණානායක වන මම, 2016 පෙබරවාරි මස 01 වැනි දින සිට, මෙහි වූ උපලේඛනයෙහි 3 වැනි තීරුවෙහි නිශ්චිතව දක්වා ඇති භාණ්ඩ සඳහා එකී උපලේඛනයෙහි 5 වැනි තීරුවේ අනුරූප සටහන්වල දක්වා ඇති සාමාන්‍ය ගාස්තු ප්‍රමාණයන් අනුව හෝ (235 වැනි අධිකාරය වන) රේගු ආඥාපනතේ ''අ'' උපලේඛනයෙහි විධිවිධාන යටතේ වරණීය ගාස්තු ප්‍රමාණයන් අය කළ යුතු වන හා ගෙවිය යුතු වන අවස්ථාවක නම් එකී උපලේඛනයෙහි 4 වැනි තීරුවෙහි අනුරූප සටහන්වල දක්වා ඇති වරණීය ගාස්තු ප්‍රමාණයන් අනුව, ආනයන තීරු ගාස්තු අය කළ යුතු බව හා ගෙවිය යුතු බවට ද, රේගු අධ්‍යක්ෂ ජනරාල්ට මෙම ආඥාව මගින් නියම කරමි.

රවි කරුණානායක,
මුදල් අමාත්‍ය.

2016 පෙබරවාරි මස 01 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

උපලේඛනය

| ශීර්ෂ අංකය (1) | සංයෝජිත වර්ගීකරණ සංකේතය (2) | | විස්තරය (3) | තීරුබදු ප්‍රමාණය | | ප්‍රමාණ ඒකකය (6) |
|---|---|---|---|---|---|---|
| | | | | වරණීය (4) | සාමාන්‍ය (5) | |
| **10.06** | | | **සහල් :** | | | |
| | | | | | | |
| | 1006.10 | - | පොතු සහිත සහල් (වී හෝ රළු ලෙස) | | කි.ග්‍රෑමයට රු. 50/- | කි.ග්‍රෑ. |
| | 1006.20 | - | දහයියා ඉවත් කළ (දුඹුරු) සහල් | | කි.ග්‍රෑමයට රු. 50/- | කි.ග්‍රෑ. |
| | 1006.30 | - | පාහින ලද හෝ ඔප දමන ලද හෝ නොලද සම්පූර්ණයෙන් හෝ අඩ වශයෙන් කෙටූ සහල් | | කි.ග්‍රෑමයට රු. 50/- | කි.ග්‍රෑ. |
| | 1006.40 | - | කැඩුනු සහල් | | කි.ග්‍රෑමයට රු. 50/- | කි.ග්‍රෑ. |

02-524/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.